චක්‍රලේඛ අංක :- 08/2008(1)

මගේ අංකය : බප/සසේකො/ලේ.නිර්/2008
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2008.09.02.

බස්නාහිර පළාතේ ලියාපදිංචි සමූපකාර සමිතිවල
සභාපතිවරුන් වෙත.

<u>2008.07.01 දින සිට බ.ප. විවිධ සේවා සමූපකාර සමිතිවල සේවකයින්ට වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීම.</u>

ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 08/2008 සහ 2008.07.10 දිනැති චක්‍රලේඛයට වැඩිදුරටත්.

02. යම් යම් සමූපකාර සමිතිවලට එම චක්‍රලේඛයේ සඳහන් වැටුප් යෝජනා සිය ලාභ සීමාව යටතේ දැරිය නොහැකි බව දැනුම් දෙයි. ඒ පිළිබඳව නැවත සලකා බැලීමෙන් අනතුරුව ඒ සහ බී වර්ගීකරණය යටතේ ඇති සමිති විසින් එකී වැටුප් ක්‍රම ක්‍රියාත්මක කළ යුතු බවත් සී වර්ගීකරණය යටතේ ගැනෙන සමිති විසින් එකී වැටුප් ක්‍රමයේ වැඩිවීමෙන් 50% ක් පමණක් ගෙවිය හැකි බවත් තීරණය කර ඇති අතර එම සමිති 2009.01.01 දින සිට එකී සම්පූර්ණ වැඩිවීම ගෙවීමට අවශ්‍ය ආදායම් මට්ටම වැඩිදියුණු කර ගැනීමට උනන්දු විය යුතුය. එදිනට එසේ ගෙවිය නොහැකි නම් හේතු දැක්විය යුතු වේ.

03. 'සී' වර්ගීකරණය යටතට ගැනෙන්නේ වී නමුදු ලාභ ප්‍රතිශතය මත සම්පූර්ණ වැඩිවීම ගෙවිය හැකි සමිති විසින් සම්පූර්ණ වැඩිවීම ගෙවීමට ක්‍රියාකළ යුතුය.

04. ඉහත පළමු ඡේදයේ සඳහන් චක්‍රලේඛය නිකුත් කර ඇත්තේ විවිධ සේවා සමිති සඳහා වුවත් සමූපකාර සමිති වශයෙන් බ.ප. සමූපකාර දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි අනෙකුත් සමූපකාර සමිතිවලට සිය ලාභ ප්‍රතිශතය නොඉක්මවන පරිදි 8/2008 චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති වැටුප හෝ [illegible] මෙම චක්‍රලේඛයේ සඳහන් පරිදි වැඩිවීමෙන් 50% ක් හෝ යන දෙකින් සුදුසු වැටුප් ක්‍රමයක් තෝරාගත හැකිය.

05. අධ්‍යාපන හා සාමාජික සම්බන්ධතා තනතුරු සහ ලේකම් තනතුරු දරන්නන් 10 වැටුප් පරිමාණය හෝ ඊට වඩා ඉහල වැටුප් පරිමාණයක පසුවන විට ඔවුනට 30% ක වැටුප් වැඩිවීමක් සලසා දිය හැකිය. එම තනතුරු දරණ අනෙකුත් අය සඳහා 25% ක වැඩිවීම අදාල කරගත හැකිය. වැඩ බැලීම හෝ රාජකාරි ඉටුකිරීම සඳහා කොමිෂන් සභා අනුමැතිය ලබා ඇත්නම් ඔවුනට ගෙවිය යුත්තේ වැඩ බැලීමේ හෝ රාජකාරි ඉටු කිරීමේ දීමනාව පමණි.

06. ආරෝග්‍යශාලා සමිති සඳහා මෙම වැටුප් ක්‍රමය යොදා ගැනීමේදී තනතුරු වල පවත්නා වෙනස්කම් නිසා අපහසු වන බැවින් දැනට අනුමත ආරෝග්‍යශාලා වැටුප් ක්‍රමයට අමතරව ලාභ ප්‍රතිශත නොඉක්මවන පරිදි මාසිකව රු. 1000/= ක ප්‍රසාද දීමනාවක් ගෙවීම 2008.09.01 දින සිට ක්‍රියාත්මක කළ හැකිය. ග්‍රාමීය බැංකු සංගම් සඳහා සහ සණස ප්‍රාථමික සමිති සඳහා මෑතකදී පිළිවෙලින් රු. 1500/= සහ රු. 1000/= ප්‍රසාද දීමනා අනුමත කර ඇති අතර, එම ආයතන වෙනුවෙන් දැනට නව වැටුප් ක්‍රම සකස් කරගෙන යනු ලැබේ.

07. සුපිරි වෙළඳසැල් කළමනාකරුවන් සහ වෙළඳසැල් කළමනාකරුවන් සඳහාත් ග්‍රාමීය බැංකු කළමණාකරුවන් සඳහාත් 08/2008 චක්‍රලේඛයෙන් සලසා ඇති විශේෂ ප්‍රසාද දීමනා ප්‍රතිශතයන් එම ආයතනවල සේවය කරන අනෙකුත් කාර්ය මණ්ඩලය එන් අයකුං වැඩිවන අවස්ථාවලදී පහත සඳහන් පරිදි විය

යුතුය.

1. කළමණාකරු - 45%
2. අනෙකුත් කාර්ය මණ්ඩලය - 55%

08. 8/2008 සහ මෙම චක්‍රලේඛය අනුව නියමිත වැටුප් ගෙවිය හැක්කේ අනුමත පිරිස්බල සේවයට ඇතුලට ගැනෙන කොමිෂන් සභාව විසින් පත්වීම අනුමත කර ඇති සේවකයින් සඳහා පම වැඩ බැලීම හෝ රාජකාරි ඉටුකිරීම සඳහා ... ගෙවිය හැක්කේ, එහි වැඩබැලීම හෝ රාජකාරි ඉටුකිරීමේ පත්වීම් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත්නම් පමණක් බවද වැඩිදුර කොමිෂන් සභාවේ නියමය පරිදි දන්වමි.

09. මෙම චක්‍රලේඛයන්හි සඳහන් කරුණු පිළිබඳ තවදුරටත් අපැහැදිලිතා ඇත්නම් කොමිෂන් ඇමතිය හැකි බවද දැනුම් දෙමි.

10. මෙම වැටුප් වැඩිවීම හේතු කොටගෙන තනතුරුවල පවත්නා ජ්‍යෙෂ්ඨතාවයට බලපෑමක් නොවේ. වැටුප් ක්‍රම නිරණය කර ඇත්තේ සමිතිවල ආදායම් ඉපැයුම් මට්ටමේදී එට සෘජු සම්බ තාවයක් හා අධීක්ෂණයක් මෙන්ම වගකීම් භාරයක් උසුලන කාර්ය මණ්ඩල දිරිගැන්වීම අරමුණු ගෙන බවද වැඩිදුරටත් දැනුම් දෙනු ලැබේ.

11. මෙම චක්‍රලේඛය බ.ප. සමූපකාර සංවර්ධන කොමසාරිස්ගේද එකඟතාවය මත නිකුත් කර ලදී.

කොමිෂන් සභාවේ නියමය පරිදි.

ජේ. ජේ. සිරිසේන,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :-
1. බ.ප. පළාත්මාර්ග හා සමූපකාර අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම්, පළාත්මාර්ග හා සමූපකාර අමාත්‍යාංශය (බ.ප.)
4. සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ)
6. ලේකම්, සමූපකාර සේවක කොමිෂන් සභාව
7. සියළුම වෘත්තීය සමිති සංගම්
8. සියළුම පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්